පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக் கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2015 අගෝස්තු
பொதுக்கலைமாணி பரீட்சை (வெளிவாரி) - 2015 ஆகஸ்ட்
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – AUGUST 2015
දර්ශනය -PHG I
සාමාන්‍ය මනෝවිද්‍යාව

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 10කින් සමන්විත වේ.
ප්‍රශ්න පහකට(05) පමණක් පිළිතුරු සපයන්න
කාලය පැය තුනක් (03) පමණයි.

---

1. ආනුභවික මනෝවිද්‍යාවේ විෂය කරුණු ගෙනහැර දක්වා විභාග කරන්න.

2. සංජානනය හා ඉගෙනුම (Perception and Language) පිළිබඳ අධ්‍යයනයන්ට ගෙස්ටෝල්ට් මනෝවිද්‍යාව (Gestault Psychology) විශාල දායකත්වයක් සැපයීය. එහිදී අවධාරණය වූයේ ගැටලු නිරාකරනය කිරීමේදී ප්‍රතිවේදයේ (insight) කාර්යභාරයයි. අදහස් දක්වන්න.

3. පෞරුෂය (personality) යනු කුමක් ද? පෞරුෂය පිළිබඳ මනෝවිද්‍යාත්මක අදහස් අප විවේචනය කරන්නේ කෙසේ ද?

4. **එක්කෝ**

   මනෝවිද්‍යා ක්ෂේත්‍රයට සිග්මන් ෆ්‍රොයිඩ්ගෙන් (Sigmund Freud) ලද දායකත්වයේ ස්වභාවය හා වටිනාකම පිළිබඳ ඔබේ නිරීක්ෂණයන් ඉදිරිපත් කරන්න.

   **නැතිනම්**

   ජැක්ස් ලැකාන් (Jacques Lacan) ඔහුගේ ***ෆ්‍රොයිඩ් වෙත නැවත පිවිසීමේ*** හි (*Return to Freud*) හඳුන්වාදුන් ප්‍රධාන තේමාවන් විභාග කරන්න.

5. පහත සඳහන් මනෝවිද්‍යාඥයින් දෙදෙනෙකුගේ දායකත්වය ඇගයීමට ලක් කරන්න.

   i. එඩ්වර්ඩ් තෝන්ඩයික් (Edward Thorndike).

   ii. විල්හෙල්ම් වුන්ඩ් (Wilhelm Wundt).

   iii. බී.එෆ්. ස්කිනර් (B.F.Skinner).

   iv. කාල් යුංග් (Carl Jung).

6. ජින් පියාජේ (Jean Piaget) ගේ ප්‍රජානන සංවර්ධන න්‍යාය පිළිබඳ මූලික අදහස් ගෙනහැර දක්වා විභාග කරන්න.

7. i). අභිප්‍රේරණ (motivation) සහ ප්‍රේරණ (drive) යන වචන විස්තර කරන්න.

   ii). ඒබ්‍රහම් මාස්ලෝ ගේ (Abraham Maslow) අභිප්‍රේරණ ආකෘතිය විවේචනාත්මකව විභාග කරන්න.

8. i). බුද්ධිය යනු කුමක් ද?

ii). බුද්ධිඵලය (IQ) කෙනෙකුගේ මානසික හැකියාවන්හි දර්ශකය වේ. මේ ප්‍රකාශය තහවුරු කරන්න.

iii). බුද්ධි සංවර්ධනය සඳහා බලපාන සාධක මොනවාද? විස්තර කරන්න.

9. i). මතකය නිර්වචනය කරන්න.

ii). කෙටිකාලීන මතකයෙන් දිගුකාලීන මතකය වෙන්කොට දක්වන්න.

iii). මතකය වර්ධනය කරගත හැකි ද? පැහැදිලි කරන්න.

10. පහත සඳහන් **දෙකක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ව්‍යුහවාදයේ වැදගත්කම.

ii. ආනුභවික මනෝවිද්‍යාවේ විධික්‍රම.

iii. මනෝවිද්‍යාව හා විද්‍යාව.

iv. අපරාධ මානසිකත්වය.

vi. චරිත සංවර්ධනයේදී සදාචාරයේ භූමිකාව.